VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 POLICE PARK PLACE, COLOMBO 05, SRI LANKA
TEL: + 94 112055544; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

# සිංගප්පූරු චින්තනය ශ්‍රී ලංකාවට පූර්වාදර්ශකයක් විය හැකිද?

2012 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව එළි දැක්වූදා ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් උගුලක (middle income Trap) උගුලක සිරවිම මගහැරීමට ක්‍රියා කල යුතු බවට මහ බැංකු අධිපති විසින් අවධාරනය කරන ලදි. " මධ්‍ය ආදායම් උගුල" යන සංකල්පය ආර්ථිකයක් ඇ. ඩො. 4000 ක පමණ ඒක පුද්ගල ආදායම් ලබන රටවල් හා සබැදෙන අතර ශ්‍රී ලංකාව වර්තමානයේ සිටින ඒක පුද්ගල ආදායම් මට්ටමේ සිට ඇ.ඩො.4000ක සීමාවට ලගා විමට තවත් බොහෝ කාලයක් ගත වනු ඇත. ඉතා සුභවාදි උපකල්පන මත පිහිටා එනම් ශ්‍රී ලංකා ආර්ථිකය 7.5% ක වාර්ෂික වර්ධන වේගයක්, 1% ක ජනගහන වර්ධන වේගයක් සහ ශ්‍රී ලංකා රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව 4% ක අවප්‍රමාණයක් සිදුවේ යැයි යන කරුණු මත පිහිටා ගණනය කිරිම සිදු කළහොත් ඇ.ඩො.4000 ක ඒකපුද්ගල ආදායම් මට්ටමට ළගා වීම සඳහා ශ්‍රී ලංකාවට වර්ෂ 2026 තෙක් බලා සිටීමට සිදුවනු ඇත. කෙසේ වුවද අනාගතය දෙස සුභවාදිව සිතීම සහ ඒ සදහා පෙර සුදානමක් තිබීම ආර්ථිකයක යහපැවැත්මට වැදගත් වේ.

"මධ්‍ය ආදායම් උගුල" පිළිබද ගැටලුවට ඉතා සාර්ථකව මුහුණ දුන් රටවල් අතර සිංගප්පූරුවට ඉතා වැදගත් ස්ථානයක් හිමිවේ. එමෙන්ම සිංගප්පූරුව ශ්‍රී ලංකාවට ආර්ථික පූර්වාදර්ශයක් ලෙස බොහෝ අවස්ථාවලදි යොදා ගන්නා රාජ්‍යයකි. සිංගප්පූරුව රාජ්‍ය පාලනය සඳහා තමන්ටම ආවේණික වු පරිපාලන ක්‍රමවේදයක් යොදා ගනි. එය එක් අතකින් මර්දනකාරී (ප්‍රජාතන්ත්‍රවාදි වශයෙන් දුර්වල) වන නමුත් අනික් අතට තාක්ෂණික ලෙස කාර්යක්ෂම පරිපාලන ක්‍රමවේදයක් වේ. න්‍යාත්මක හෝ ප්‍රත්‍යක්ෂ ලෙස මෙම පරිපාලන ක්‍රමවේදිය හේතුඵල ලෙස මනා සුසංයෝගයක් ලෙස ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි යන්න පිළිබදව විවරණයක් සැපයීම දුෂ්කරය. ශ්‍රී ලංකාවට සිංගප්පූරුව මෙන් තිරසාර වුත් දීර්ඝකාලීම වුත් ආර්ථික වෘද්ධියක් ලගා කරගැනීමට සැබෑ අවශ්‍යතාවයක් තිබේ නම් අවධානය යොමු කල යුතු ප්‍රධාන කරුණු කිහිපයකි. එනම් මනා ආර්ථික නියාමනය , වෙළඳපොල වල කාර්යක්ෂමතාවය දියුණු කිරිම , නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම , සමාජ සම්මතිය සහ ජාත්‍යන්තර සහයෝගිතාවය යන සාධකයන්ය.

බර්ටල්ස්මාන් පරිවර්තන දර්ශකය (Bertelsmann Transformation Index) යනු දියුණු වෙමින් පවතින රටවල් ප්‍රජාතන්ත්‍රවාදි රාමුවක් තුල ක්‍රියාත්මක වන වෙළඳ ආර්ථිකයක් ගොඩ නැගිම සඳහා සමාජය කුමන දිශානතියකට හසුරුවන්නේ ද යන්න පිළිබද මිනුම් දණ්ඩක් සපයන දර්ශකයකි. මෙවර

ලිපිය තුලින් මෙම දර්ශකය තුල සිංගප්පූරුවට සාපේක්ෂව ශ්‍රී ලංකාවෙහි කාර්යසාධනය පිලිබද විවරනයක් සැපයිමට බලාපොරොත්තු වෙමු.

රූපරාමුව 01 මගින් ආර්ථික දේශපාලනික සහ ආයතනික සාධක මත පිහිටා ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර සංසන්දනයක් සිදු කරනු ලබයි. මෙහිදි ශ්‍රී ලංකාව සියලුම ආර්ථික සාධකයන් තුල සිංගප්පූරුවට සාපේක්ෂව පසුගාමි තත්වයක පසුවන අතර නීතියේ ආධිපත්‍ය (Rule of Law), ජාත්‍යන්තර සහයෝගිතාවය (International Cooperation), සම්මුතියක් ගොඩනැගිම (Consensus Building) සහ රාජ්‍යභාවය (Stateness) වැනි අංශ තුලද ශ්‍රී ලංකාව සිංගප්පූරුවට සාපේක්ෂව දැඩි පසුබෑමක් දක්වන ලදි.

මෙහිදි අවධානය යොමු කල යුතු ප්‍රධාන සාධකය වන්නේ ශ්‍රී ලංකාව පසුගිය කාල පරාසය තුල ඉහත සදහන් කල අංශ තුල සිංගප්පූරුවට සාපේක්ෂව දියුණුවක්, යම් ප්‍රගමනයක් ලගා කර ගැනිමට සමත් වි ඇත්ද යන්නයි. මෙම කරුණ ගවේෂණය කිරිමේ දි පෙනි යන්නේ බොහෝ අවස්ථාවන් හිදි ශ්‍රී ලංකාව මෙම අංශ තුල ප්‍රගතියක් වාර්තා කිරිමට අසමත් වී ඇති බවයි. රූප සටහන 02 මගින් 2006 සහ 2012 යන සාපේක්ෂ වර්ෂ 02 තුල ශ්‍රී ලංකාව ලබාගත් ලකුණු සංඛ්‍යාව පිලිබද සංසන්දනයක් සිදු කරනු ලබයි. මෙහිදි ශ්‍රී ලංකාව "රාජ්‍යභාවය" යන අංශය තුල සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කර ගැනිමට සමත්ව ඇත. මෙහිදි "රාජ්‍යභාවය" යන්නෙන් ප්‍රකාශ වන අදහස වන්නේ රජයකට බලාධිකාරය සම්බන්ධව පවතින ඒකාධිකාරය , රාජ්‍ය අනන්‍යතාවය , ආගමික ලබ්ධින් සම්බන්ධව බාධාකාරිව මැදිහත් නොවිම , සාමාන්‍ය පරිපාලනය යන කරුනු තුල ප්‍රගමනයයි. විශේෂයෙන්ම 2009 යුධ ජයග්‍රහනයන් සමගම රාජ්‍යභාවය පිලිබද විශාල ඉදිරිපිම්මක් පැනිමට ශ්‍රී ලංකාව සමත් වේ.

කෙසේ වුවද ප්‍රජාතාන්ත්‍රික වශයෙන් සහ යහපාලනය සම්බන්ධව වැදගත් වන අනෙකුත් අංශයන් තුල ශ්‍රී ලංකාව **2006** ට සාපේක්ෂව පසුබෑමකට ලක්ව ඇත. විශේෂයෙන්ම නීතියේ ආධිපත්‍ය , ජාත්‍යන්තර සහයෝගිතාවය සහ සංහිඳියාව ගොඩනැගිම යන අංශ තුල ශ්‍රී ලංකාව සැලකිය යුතු පසුබෑමකට ලක්ව ඇත.

රූප සටහන 03 මගින් ප්‍රජාතන්ත්‍රවාදි වශයෙන් දුර්වල පසුබිමක් තුල වුවද ඉහල ඒකපුද්ගල ආදායමක් පවත්වාගෙන යාමට සිංගප්පූරුවට ඇති හැකියාව මැනවින් විදහා පායි. මෙම රූපසටහනේ තිරස් අක්ෂය මගින් වෙළද පොල ආර්ථික රටාවෙහි කාර්යක්ෂමතාවය මැන දක්වන අතර සිරස් අංශය මගින් ප්‍රජාතාන්ත්‍රික ආයතන වල ක්‍රියාකාරි ශක්‍යතාවය පිලිබද මිනුම් දඬුවක් සපයනු ලබයි. ඒ අනුව මෙහි දකුණු පස ඉහල කෙළවරට අයත් වන්නේ නම් එය කාර්යක්ෂම අර්ථක්‍රමයක් සහ ප්‍රජාතාන්ත්‍රවාදි ආයතනික රටාවකට හිමිකම් කියන රාජ්‍යයක් ලෙස විග්‍රහ කල හැක. එමෙන්ම වම්පස පහල කෙලවරට අයත් වන්නේ නම් එහි ප්‍රතිවිරුද්ධ තත්වයන් පිලිබිඹු වේ. එමෙන්ම මෙහි දක්වා ඇති රටවල් නියෝජනය කරනු ලබන පැහැය මගින් එම එක් එක් රටෙහි ඒකපුද්ගල ආදායිම් මට්ටම නියෝජනය

කොට දක්වයි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාව මෙම රූප සටහන මගින් මැදගනයේ ඒක පුද්ගල ආදායමක් සහිත ආර්ථික කාර්යක්ෂමතාවය පිලිබඳ ක්‍රියාකාරිත්වයෙහි අඩුලුහුඩුකම් සහිත ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ විශාල අඩුලුහුඩුකම් සහිත රටක් ලෙස වර්ගීකරණය කොට දක්වා ඇත.


මෙම රූප සටහනෙහි දක්වා ඇති රටවල් සියල්ල අතුරින් 29 ක් පමන ඉහල ඒකපුද්ගල ආදායම් ලබන රටවල් වන අතර ඉන් 80% ක් පමන ඉහල ප්‍රතිශතයක් (රටවල් 23 ක්) මෙම රූපසටහනෙහි ඉහල දකුනු චතුර්තක භාගයට අයත් වේ. මෙම 80% ප්‍රතිශතයට අයත් නොවන ඉහල ඒකපුද්ගල ආදායම් උපයන රටවල් 06 මූලික වශයෙන් ස්වාභාවික සම්පත් උරුමය (ඛනිජ තෙල් සහ ගෑස් වැනි) මුල් කොටගෙන දියුනු වූ රටවල්ය. සිංගප්පූරුව හා සමාන මට්ටමේ ඒක පුද්ගල ආදායම් උපයන රටවල් සාපේක්ෂ වශයෙන් ඉහල මට්ටමේ ප්‍රජාතාන්ත්‍රික ආයතන තන්ත්‍රයකට හිමිකම් කියයි.
ශ්‍රී ලංකාව ඉතා මෑතකදි අඩු ආදායම් උපයන මට්ටමේ සිට ඉහලට ගමන් කිරීම සිදු වූ අතර ඇ.ඩො. 4000 ක ඒක පුද්ගල ආදායම් මට්ටමක් ළගා කර ගැනිම සදහා තවත් වසර 12 - 15 ක් පමණ බලා සිටීමට සිදුවනු ඇත. ඉහල ආර්ථික වර්ධනයක් ලගා කර ගැනිමට කෙටිකාලීන වශයෙන් සිදු කල හැකි ප්‍රතිකර්මයන් තිබුනද ඒවා සත්‍ය වශයෙන්ම තිරසාර නොවන බවට අප විසින් මීට පෙර කරන ලද විශ්ලේෂණ වලදි පෙන්වා දෙන ලදි. කෙසේ වුවද මහ බැංකු අධිපතිතුමන් විසින් මධ්‍ය ආදායම් උගුල පිළිබඳව කථාකිරීම තුලින් ආර්ථිකය පිලිබඳ දීර්ඝ කාලීන විපරමකින් පසුවීමේ වැදගත්කම පිලිබඳව කරුණු ඉදිරිපත් වේ.

මෙලෙස දීර්ඝ කාලීන විපරමක් යුතුව කරුණු දෙස අවධානය යොමුකිරීමේ දි ප්‍රජාතාන්ත්‍රික ආයතනික රටාව දියුණු කරගෙන ඉහත රූපය ඉහල දකුණු චතුර්ථකයට ගමන් කිරීමට ශ්‍රී ලංකාව ඉතා හොඳ ඉඩ ප්‍රස්ථාවක් පවතින බව පැහැදිලි කරුණකි. මෙහිදී මුහුනපෑමට සිදුවන ප්‍රධාන ගැටලුව වන්නේ දේශපාලනික මැදිහත්වීම්ය. එනම් ප්‍රජාතාන්ත්‍රික ඒකාබද්ධතාවයක් ඇති කිරීමට දේශපාලනික මැදිහතවීම් අත්‍යවශ්‍ය සාධකයක් වන අතර එය විධිමත්ව සමබරතාවයකින් යුතුව සිදුනොවුනහොත් ආර්ථික කාර්යක්ෂමතාවයට පවා දැඩි පහරක් එල්ල වනු ඇත.


ප්‍රජාතාන්ත්‍රික ලෙස දුර්වල ආයතනික රාමුවක් තුල ඉහල ඒකපුද්ගල ආදායමක් ලගා කර ගැනිම සිංගප්පූරුවට ආවේනික වූ ප්‍රායෝගික වශයෙන් යථාර්තයක් බවට පත් කරගැනිම අසීරු කරුණකි. එම නිසාම සිංගප්පූරු මොඩලය අනුගමනය කිරීම හෝ එය පූර්වාදර්ශකයක් ලෙස යොදා ගැනිම එතරම් තාත්වික නොවේ. ඛනිජ සම්පත් සොයා ගැනිම වැනි කරුණක් මුල් කොටගෙන ඉක්මන් ආර්ථික වර්ධන මූලාශ්‍රයක් ගොඩනැගුනහොත් හැර ඉතා කෙටි කාලයක් තුල ඉහල ඒක පුද්ගල ආදායම් මට්ටමක් සාක්ෂාත් කර ගැනිම අසීරු කරුණකි. එම නිසාම වර්ධනය කල යුතු අංශයන් (එනම් ප්‍රජාතාන්ත්‍රික ආයතනික රාමුවක් ගොඩ නැගිම) සාධනීය ලෙස වර්ධනය කර ගැනිමට අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

**රූප සටහන 01 බර්ටල්ස්මාන් පරිවර්තන දර්ශකය 2012**


**ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව**



**රූප සටහන 02 බර්ටල්ස්මාන් පරිවර්තන දර්ශකය ශ්‍රී ලංකාව 2006 2012**



**රූප සටහන 03: වෙළඳ ආර්ථිකය සහ ප්‍රජාතාන්ත්‍රික ආයතන රාමුව අතර ඒකාබද්ධතාවය**




**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**